# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,793 - 2013 ජනවාරි 11 වැනි සිකුරාදා - 2013.01.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | 126 |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා සියලු ම දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 පෙබරවාරි මස 01 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජනවාරි මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


125 - B 80681 — 2,200 (2013/01)
D 1 -

# දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම්

## කඩුවෙල දිසා අධිකරණයේ දී ය

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 16 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

නඩු අංකය : 409/L
ස්වභාවය : ඉඩම්
කාර්යය පටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු. 1,500,000

1. සද්ධාතිස්ස අබේසිංහ ගුණවර්ධන,
අංක 146/6ඒ, දුටුගැමුණු වීදිය,
කොහුවල

සහ

අංක 1/1, රත්නායක මාවත, පැලවත්ත.

2. චන්ද්‍රිකා ප්‍රියදර්ශනී ගුණවර්ධන,
(විවාහයට පෙර විජේවර්ධන)
අංක 146/6ඒ, දුටුගැමුණු වීදිය,
කොහුවල

සහ

අංක 1/1, රත්නායක මාවත, පැලවත්ත.

........................................................ පැමිණිලිකරුවන්.

එදිරිව

1. සෝමවංශ අමරසිංහ,
නායක,
ජනතා විමුක්ති පෙරමුණ,
අංක 464/20, බැන්ක් හිල් එස්ටේට්,
පැලවත්ත, තලංගම දකුණ,
බත්තරමුල්ල.

2. මේස්ත්‍රිගේ ටිල්වින් සිල්වා,
ලේකම්,
ජනතා විමුක්ති පෙරමුණ,
අංක 464/20, බැන්ක් හිල් එස්ටේට්,
පැලවත්ත, තලංගම දකුණ,
බත්තරමුල්ල.

3. අනුර දිසානායක,
මුදල් ලේකම්,
ජනතා විමුක්ති පෙරමුණ,
අංක 464/20, බැන්ක් හිල් එස්ටේට්,
පැලවත්ත, තලංගම දකුණ,
බත්තරමුල්ල.

ජනතා විමුක්ති පෙරමුණෙහි සාමාජිකයින් සඳහා හා ඔවුන් වෙනුවෙන්.

............................................... විත්තිකරුවන්.

ඉහත නම් සඳහන් 1, 2 සහ 3 වැනි විත්තිකරුවන් වෙතයි.

මෙම නඩුව සුදුස්සක් කිරීම සඳහා කඩුවෙල දිසා විනිසුරු තැන්පත් ඩී. එෆ්. එච්. ගුණවර්ධන මැතිතුමා ඉදිරිපිට දී කැඳවූ අවස්ථාවේ දී පැමිණිලිකරුවන්ගේ පැමිණිල්ල, දිවුරුම් ප්‍රකාශය සහ "පැ1" සිට පැ45අ" දක්වා ඇමුණුම් කියවා බැලීමෙන් පසුව හා පැමිණිලිකරුවන් වෙනුවෙන් කරන ලද කරුණු සැලකිරීම්වලට සවන් දීමෙන් පසුව සෑහීමට පත්ව පහත සඳහන් පරිදි වර්ෂ 2012ක් වූ දෙසැම්බර් මස 17 වැනි දින නියෝග කර ඇත.

"ඉදිරිපත් කර ඇති කරුණු වලට අවධානය යොමු කරමි. ඒ සම්බන්ධයෙන් සෑහීමට පත්වෙමි. ඒ අනුව මුල් අවස්ථාවේ දී පැමිණිල්ලේ ආයාචනයේ "ඊ" ඡේදයේ අයැද ඇති පරිදි අතුරු ඉන්ජන්ෂන් නොතීසි සහ සිතාසි ද, "උ" ඡේදයේ අයැද ඇති පරිදි නොතීසි ද පලකිරීමට අවසර දෙමින් නියෝගයක් නිකුත් කරමි. ඒ අනුව අදාල නොතීසි පලකිරීම ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල සහ ගැසට් පත්‍රයේ භාෂා 3න් පල කළ යුතු බව ද දැනුම් දෙමි."

අධිකරණයේ අණ පරිදි,

රෙජිස්ට්‍රාර්,
කඩුවෙල දිසා අධිකරණයේ දී ය.

වර්ෂ 2012ක් වූ දෙසැම්බර් මස 18 වැනි දින දී ය.

සකස්කර ඉදිරිපත් කරන ලද්දේ,

පැමිණිලිකරුවන්ගේ නීතිඥවරුන්.

01-300

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.